# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/17 - 2022 නොවැම්බර් 30 වැනි බදාදා - 2022.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2022 දෙසැම්බර් මස 01 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වැනි වගන්තිය යටතේ පනවන ලද 2022 සැප්තැම්බර් මස 22 දිනැති අංක 2298/51 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් බොම්බයි ළූණු (රේගු සංකේතාංක 0703.10.20) සඳහා ප්‍රකාශිත නියමය සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ පනවන ලද 2022 මැයි මස 18 දිනැති අංක 2280/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ටින්මාළු (රේගු ශීර්ෂ අංක 16.04) සඳහා ප්‍රකාශිත නියමය 2022 දෙසැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 6075 — 481 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| 2 | 04.05 | 0405.10 | වෙඬරු | කි. ග්‍රෑමයට රු. 1,500 |
| | | 0405.20 | කිරිවලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| 3 | 04.06 | 0406.20 | සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි. ග්‍රෑමයට රු. 600 |
| 4 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 10 |
| 5 | 08.04 | 0804.10.10 | රටඉඳි - අළුත් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 0804.10.20 | රටඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු. 200 |
| 6 | 08.05 | 0805.10.10 | දොඩම් - අළුත් | කි. ග්‍රෑමයට රු. 600 |
| 7 | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු. 600 |
| 8 | | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු. 600 |
| 9 | 08.08 | 0808.10 | ඇපල් | කි. ග්‍රෑමයට රු. 600 |
| 10 | 08.10 | 0810.90.90 | අනෙකුත් (පළතුරු) | කි. ග්‍රෑමයට රු. 600 |
| 11 | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටො (සර්ඩා විශේෂයන්) | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.17 | ආඳන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි. ග්‍රෑමයට රු. 200 |

EOG 12-0055

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.